# ජීවන සිහිනයේ මල් පිපුන මොහොතක්

වියදම් කරන්න විධියක් තිබුණේ නම් නැහැ මං හිතුවේය පුතා ආපහු විශ්ව විද්‍යාලයෙන් ගෙන්න ගන්නයි" යනුවෙන් මව කියද්දී නොසිඳී ගිය බලාපොරොත්තුවන බැල්මෙන් පුතා තමා ලද ශිෂ්‍යත්ව සහතිකය දෙස බලා සිටියේ ය. "හොඳ වෙලාවට ශිෂ්‍යත්වයක් ලැබුණා" යයි පුතා කියන විට මවගේ මුව පුරා ඇඳී ගියේ මහත් අස්වැසිල්ලක සේයාවකි.

මේ මවත් පුතුණුවනුත් මට හමුවූයේ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී ය. ඔවුහු උත්සවය හමාර වූ පසුද සෑහෙන වෙලාවක් යනතුරු ශාලාවේ ඉදිරි බරාඳයේ නො උස් බැම්ම මත වාඩි වී සිටියහ.

මම ඔවුන්ගෙන් තොරතුරු ඇසුවෙමි. ඔවුහු දෙඩන්ගස්ලන්ද කවිසිගමුවෙන් පැමිණි අය වූහ. විසි හැවිරිදි පුතාගේ නම ඩග්ලස් පොන්සේකාය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට ඇතුල් වී ඇත්තේ ද කවිසිගමුව මධ්‍යම මහ විද්‍යාලයෙනි. දරුවන් හය දෙනෙකුගේ පවුලක වැඩිමලා ඔහුය. පියාට ස්ථිර රැකියාවක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැත. ඉඩකඩම් කුඹුරුද නැත්තේය.

"පුතා විශ්ව විද්‍යාලයට තේරුණු බව දැන ගත්තම ලොකු සතුටක් ඇති වුනා. නමුත්, වියදම් කරන්නෙ කොහොමද කියලා කල්පනා වුණාම හිතට ලොකු දුකක් ඇති වුණා. මම පුතා එක්ක යමක් කමක් තියෙන නෑ හිතවතුන් ළඟට ගිහින් පුතා ලව්වා බුලත් දීලා විශ්ව විද්‍යාලයට තේරුණු බව කිව්වා. ඒ කොල්ලො පුළුවන් හැටියට උදව් කළා" යයි මව මා හා කියද්දී ,' මේ මං ඇඳගෙන ඉන්න ඇඳුම මේ දාගෙන ඉන්න සපත්තු කුට්ටම ඒ අය දීපුවා" යයි පුතා කීවේය.

'අපි පොඩි ගෙයක් හදන්න කියල කාලෙක ඉඳල බඩු ටිකක් එකතු කරගෙන හිටියා. මේ උත්සවයට එන්නම ඕන කියල හිතුන නිසා ඒ උළුවහු කීපයක් විකුණුවා" යයි මව කීවේ තම පුතු ලද ශිෂ්‍යත්වය ඊටත් වඩා වැදගත් වන හෙයින් ඒ ගැන කම්පා නොවන බවත් අඟවමිනි.

තමා ලද ශිෂ්‍යත්වය පිළිගැනීම සඳහා පැමිණ සිටි හාලිඇල බෝගහමඩිත්තේ ඒ. එම්. වීරසිරි ශිෂ්‍යයා සමඟද මම කතාවට වැටුණෙමි. ඔහුගේ පියා උඩුවර සංවර්ධන සභා උප කාර්යාලයේ කම්කරු මහතෙකි. පියාගේ ආදායම රුපියල් 400 ක මාසික වැටුප පමණි. එහෙත් ඔහු නඩත්තුවීමට දරුවන් හය දෙනෙකුගේ පවුලක් වෙයි. වීරසිරි පවුලේ වැඩිමලාය. දෙමෝදර නාඋල්ල මහා විද්‍යාලයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යා අංශයට ඔහු ඇතුළුවද්දී ඔහුට බාල සහෝදරයා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශයට ඇතුල් වී සිටියේය.

වීරසිරිට තිබූ ප්‍රශ්නය විශ්ව විද්‍යාලයට තේරී සිටින දරුවන් දෙදෙනෙකුට තම පියා වියදම් කරන්නෙ කෙසේද යන්නයි. එහෙයින් මහපොළ ශිෂ්‍යත්වය ඔහු පිළිගත්තේ ආශිර්වාදයක් හැටියටය.

කෙනෙකුට කෙනෙක් නොදෙවෙනි ලෙස ඉවසීමට සමත්කම් දක්වන වීරසිරිගේ පවුලේ කතාවේ දුක්බර පැත්තක්ද වෙයි. ඒ ඔහුත් සහෝදරයාත් විශ්ව විද්‍යාලයට ඇතුළුවීමෙන් පසු ඔවුන්ගේ වියදම් සොයා ගැනීම සඳහා මව කළුගල් කැඩීමට යාමය.

"අපට වියදම් කරන්න අම්මා මෝලක කළුගල් කඩන්න ගියා." අපිත් මල්ලිත් ඉස්කෝලෙ ගිහිල්ලා ආවම කළුගල් කඩලා කීය කීය හරි හොයලා දෙනවා" යයි වීරසිරි කීවේය.

පියවි නෙතින් ලොව දැක, එය අවබෝධ කර ගන්නවත් පෙර දෙනෙත නොපෙනී ගිය ශිෂ්‍යයෙකු ශිෂ්‍යත්වලාභීන් අතර විය. ඔහු ලැබුවේ වෙළඳ හා නාවික අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතා විසින් තම දෙමාපියන් සමරීම සඳහා පුද්ගලික ධන පරිත්‍යාගයෙන් පිරිනම ලද ශිෂ්‍යත්වයකි. කැළණිය

# සතුට සිනා මැද බලාපොරො

**විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට ඇතුල් වී සිටින එම ශිෂ්‍යයාගේ නම යූ ඩී. ඇන්. ජයරත්නය.**

ජයරත්න පැවසූ අන්දමට ඔහුගේ දෑස නොපෙනී ගොස් ඇත්තේ වයස අවුරුදු තුනේදී මාන්දමට ගොදුරු වීමෙනි. පසුව ඇසක් බද්ධ කළද එය සාර්ථක වී නැත. දෑස නොපෙනුනද නුවනැස පාදගෙන මනස දියුණු කරගන්නට ශිෂ්‍යත්වයක් ලද ඔහු එය ඔහුගේ ජීවිතයේ ලද ලොකුම ජයග්‍රහණය හැටියට පිළිගත්තේය.


යාපනෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුල් වී සිටින ජේ. රාමනාදන තමා ලද මහපොල ශිෂ්‍යත්වය පිළිගත්තේ "එය මගේ අධ්‍යාපනය වෙනුවෙන් මවට දරන්නට සිදුව ඇති බර සැහැල්ලු කිරීමට හේතු වී ඇතැ"යි කියමිනි.

"දහසක් ආර්ථික අමාරුකම් මැද උසස් අධ්‍යාපනය ලැබීමට සිදු වූ අප වැනි වැනි දුප්පතුන්ට වෙළඳ ඇමතිතුමා ශිෂ්‍යත්ව ලබාදුන්නේ දෙවියෙක් එවිට වූ ආකාරයට" යයි හම්බන්තොටින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුල් වී සිටින රිදියගම ගමගේ ලයනල් ජේමසිරි කිය.

එදා එම ඓතිහාසික දිනය වූ 1981 නොවැම්බර් 14 වෙනිදා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ජනාධිපතිතුමා අතින් ශිෂ්‍යත්ව ලැබුවෝ ඔවුහුය. වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත් මුදලි මහතාගේ නිර්මාණත්වයෙන් බිහි වූ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලෙන් ශිෂ්‍යත්ව ලැබූ එම මුල් කණ්ඩායමට විශ්ව විද්‍යාලයේ සිසුහු 412 දෙනෙක් ඇතුළත් වූහ. ඔවුන්ගෙන් වැඩි පිරිස රටේ සාමාන්‍ය ගොවි කම්කරු ජනතාවගේ දරුවෝය.

මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල බිහි වූයේ ඉගෙනීමට දක්ෂකම් ඇති එහෙත් වියදම් කිරීමට ශක්තියක් නැති දරිද්‍රතාවයෙන් පෙළෙන ජාතියේ දරුවනට උදවීම සඳහාය. "කොහේද මා හෙට මගේ කෑම වේල සොයා නෙතෙ" යයි සිතන්නට සිදුව ඇති, කෙනෙකුට අධ්‍යාපන කටයුතුවල හරි හැටි නිරතවීම අසීරුය. අධ්‍යාපන කටයුතුවල නිරතවීමට ඔවුන්ගේ සිත් සැහැල්ලු විය යුතුය. මනස නිරවුල් විය යුතුය. මහපොල ශිෂ්‍යත්වලාභීන්ගෙන් සියයට 90 ක් ආර්ථික වශයෙන් අන්තිම අමාරු අයගෙන් තෝරා ගනු ලැබුවේ එබැවිනි. ඔවුනට සිය උසස් අධ්‍යාපනය සම්පූර්ණකර ගන්නා තුරු මසකට රුපියල් 350 බැගින් ලබාගත හැකිවෙයි. ශිෂ්‍යත්වලාභීන්ගෙන් ඉතිරි සියයට 10 තෝරාගනු ලැබුවේ හුදු දක්ෂතාවය මතය. ඔවුනට මසකට රුපියල් 100 බැගින් ලැබෙයි.

ශිෂ්‍යත්ව වැඩ පිළිවෙල බිහි වූ කතා පුවතෙහිද එක්තරා අපූර්වත්වයක් ඇත. එහි නිර්මාතෘ ලලිත් ඇතුලත්මුදලි මහතාගේ වචනයෙන් කියන්නේ නම් 'එය වෙළඳාමට හදවත එක් කිරීමේ' කතාවකි.



සීමා සහිත ආර්ථිකයක් යටතේ අබල දුබල වී තිබූ වෙළඳ සංස්ථා ආයතන රැසක් විවෘත ආර්ථිකය යටතේ පණ ගැන්වීමෙන් පසු එහි ප්‍රතිඵල ගැමි පාරිභෝගික ජනතාව වෙත ගෙන යන්නට මහපොල බිහිවූයේය. වෙළඳ හා නාවික නියෝජ්‍ය ඇමති එම්. ඇස්. අමරසිරි මහතා ප්‍රථම මහපොල තම හිමිදුම ආසනයට ගෙන එයට සාර්ථක පදනමක් දැමීය. දැනට දිවයින පුරා ආසන 40 කට ගමන් කොට ඇති මහපොල මූලික වශයෙන් පාරිභෝගික ආරක්ෂක ව්‍යාපාරයක් විය.


# තුව මල් පල ගැන් වී - - - -

රක්ෂක
ශයේ
නිලධාරි
සිංහ
නි

එමගින් පාරිභෝගික භාණ්ඩයක නියම මිල පාරිභෝගිකයාට දැනගන්නට සලස්වන අතර, පාරිභෝගික ආරක්ෂක නීති රීති පිළිබඳවූ අධ්‍යාපනයක්ද ලබා දෙන්නේය. මහපොල ප්‍රවේශ පත්‍ර ශාස්තුව එය පැවැත්වෙන විදුහලේ දියුණුවට පිරි නැමීමෙන් රටේ අනාගත පරපුරේ අධ්‍යාපනයටද මහපොල අත දෙන්නට විය. එහෙත් මහපොල අග්‍රඵලය වූයේ එය ඇසුරෙන් බිහිවූ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලයි. තව වසර තුන හතරකින් වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් හා වෙනත් ක්ෂේත්‍ර වල ශාස්ත්‍රවේදීන් හැටියට බිහිවන පාජ්ශයේ දරුවන් 112 දෙනෙකු අද ඒ සඳහා විශ්ව විද්‍යාල වල අධ්‍යාපනය ලබන්නේ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වවලිනි.


කතාව අග සිට මුලට කියන්නේ නම් මහ පොල ශිෂ්‍යත්ව අරමුදල බිහිවූයේ මහපොල ඇසුරෙනි. මහපොල බිහිවූයේ එමගින් ගමට ගෙන යන්නට භාණ්ඩ තිබූ බැවිනි. භාණ්ඩ හිඟය තුරන් කරන්නට හැකිවූයේ විවෘත වෙළඳ ක්‍රමයෙනි එහෙයින් විවෘත වෙළඳ ක්‍රමයක් නොවූවා නම් මහපොලක්වත්, ඉගෙනීමට දක්ෂකම් ඇති දිලිඳු පවුල්වල දරුවනට ශිෂ්‍යත්ව පිරිනමන්නට ශිෂ්‍යත්ව අරමුදලක්වත් නැත යන සත්‍යය අප පිළිගත යුතුව ඇත්තේය.

මහපොලත් ඒ ඇසුරෙන් බිහි වූ ශිෂ්‍යත්ව අරමුදලත්, ඒ හා සම්බන්ධ මූළමහත් ක්‍රියාදමයත් යටින් දිවයන්නේ වෙළඳාමට එක් කිරීමේ කාථාවයි. එම ජයග්‍රහණයෙන් අද අපි නොමඳ ආස්වාදයක් ලබන්නෙමු.



# බලා සිටියෝය ඔහු සතුටු හැඟුමෙන් මෙලෙසින

# දෙනෙතින් නොදුටුවත්



දෘශ්‍යාබාධිත ශිෂ්‍යයෙකු වන මම කැළණි විශ්ව විද්‍යාලයෙහි 1981-82 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යාපනය ලබමි. පොතුහැර මහා විද්‍යාලයේදී උසශ් පෙළ සමත් මට ඔබතුමා විසින් පුද්ගලිකව ශිෂ්‍යත්වයක් පිරිනමනු ලබන බව ගුවන් විදුලියෙන් හා පුවත් පත් මගින් දැන ගතිමි. අප නිවසේ තිබෙන උග්‍ර ආර්ථික ප්‍රශ්න දෙස බලන විට ඔබ තුමාගේ එම පරිත්‍යාගය ඉතා ඉහළික මා අගය කළ යුතුය. එවන් උපකාරයක් කිරීමට ඉදිරිපත්වීම ගැන මම ඔබ තුමාට ඉතා ගෞරව පූර්වකව ස්තුතිය පුදකර සිටිමි. එපමණක්ද නොව, ඒ ශිෂ්‍යත්වයෙන් නිසි ඵල ප්‍රයෝජන ලබා ගැනීමටත්, රටට, ජාතියට හිතැති පුරවැසියෙකු වීමටත්, මම මෙයින් පොරොත්තු වෙමි. මාගේ දෙමව්පියන් හා ඥාති හිතමිත්‍රාදීන් වෙනුවෙනුත් ඔබතුමාගේ මෙම පරිත්‍යාගයම මම මගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි.

යූ. ඩී. එන්. ජයරත්න

(ඇමතිවරයා වෙත එවා තිබූ ලිපියකින්)